ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පසු අස්වනු කළමනාකරණ කළනාකරණ ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික පසු අස්වනු කළනාකරණ ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිලවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු රු.2,690,000 ක සූර්ය පැනල සවිකිරීමේ වියදම, ඉකුත් වර්ෂයේදී ව්‍යාපෘති සංවර්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණද, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර අතිතානුයෝගීව ගැලපීම් කර නොතිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර අතිතානුයෝගීව නිවැරදි කර ඉදිරිපත් කරන බව	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	රු.553,930 ක ප්‍රත්‍යාගණන ඌනතාවයක් ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් හිලව් නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර අතිතානුයෝගීව නිවැරදි කර නොතිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර අතිතානුයෝගීව නිවැරදි කර ඉදිරිපත් කරන බව	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු, ආයතනය විසින් භාවිතා කරන අක්කර 19 ක ඉඩම, හම්බන්තොට පළතුරු පල්ප නිෂ්පාදන මධ්‍යස්ථානය සතු රු.767,835 ක් වූ උපකරණ අයිතම 14 ක්, පුහුණු වැඩසටහන් වලදී ප්‍රදර්ශන භාණ්ඩ ලෙස යොදා ගන්නා යන්ත්‍ර හා මෙවලම් ආකෘති 43	ආයතනයේ නමට ඉඩමේ අයිතිය ලැබී නොමැති අතර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වටිනාකමක් ලබා දී නොමැති බැවින් ගිණුම්වල සටහන් කර නොමැත. හම්බන්තොට පළතුරු පල්ප මධ්‍යස්ථානය සතු උපකරණ වලින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොමැති අයිතම පරීක්ෂා කර බලා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත්	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ක් සහ ඉංජිනේරු අංශය සතු වායු සමීකරණ යන්ත්‍ර 17 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව	
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ අනෙකුත් උපකරණ ප්‍රත්‍යාගණනය කර තිබුණද ප්‍රත්‍යාගණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 90 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු ස්වාධීන තක්සේරුකරුවකු යොදා ගත්තේද යනවග, ව්‍යාවහාර කළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන් ආදී අදාළ අනෙකුත් කරුණු මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.	වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදි ස්වාධීන තක්සේරුකරුවෙකු යොදා නොගත් අතර ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු හා කාර්මික නිලධාරීන්ගෙන් සමන්විත තක්සේරු කමිටුවක් මඟින් ප්‍රත්‍යාගණනය කරන ලදි. තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් සටහනක් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා ඇත. ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කටයුතු වලදී ප්‍රමිතියට අනුව සිදු කරන බව	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	රු.48,968,074 ක් වු පාරිතෝෂික වෙන්කිරිම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 77 ඡේදය ප්‍රකාරව ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කර ගණනය කර නොතිබුණු අතර 141 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 3.4 යටතේ සේවක ප්‍රතිලාභ වගකීම වර්තමාන අගය යටතේ වාර්තා කර ඇති බව සාවද්‍ය ලෙස දක්වා තිබුණි.	ගිණුම් ප්‍රමිත අංක 19 හි 77 වගන්තියේ සඳහන් ක්‍රමවේදය තරමක් සංකීර්ණ ක්‍රමයක් බැවින් එය භාවිතා කර නොමැති අතර මෙම ක්‍රමවේදය ගැන හා එහි ප්‍රායෝගික බව ගැන අවධානය යොමු කර ඉදිරියේදී එය අනුගමනය කිරීමට කටයුතු කරන බව	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6 නිති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය	ආයතනය විසින් එකතුව රු.මිලියන 20 ක් වු ස්ථාවර තැන්පතු 02 ක් සහ රු.මිලියන 16.04 ක ඉතුරුම් තැන්පතු 02 ක් පවත්වා ගෙන තිබුණද ඒ සඳහා පනත ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහ අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර, මෙම අතිරික්ත මුදල් මහා භාණ්ඩාගාරයේ	මෙම රු. මිලියන 20 ආයතනය ආරම්භයේදී ලබා දී ඇති රු. මිලියන 300 න් ඉතිරි වී ඇති ශේෂයකි. ඉතිරිකිරීමේ ගිණුම් දෙක මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව ආයතනයට මුදල් ආයෝජනය කළ නොහැකි	මුදල් පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජන කටයුතු සඳහා විධිමත් අනුමැති ලබා ගැනීමටත්, විධිමත් අනුමැතිය යටතේ ආයෝජන

		තැන්පත් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. එසේම රු.මිලියන 16.04 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය නොකර සාමාන්‍ය ඉතුරුම් ගිණුමක තබාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 841,990 ක පොළී ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.	බැවින් ඒවා ඉතිරිකිරීම් ගිණුම්වල පවත්වා ගෙන ගිය අතර එම ගිණුම් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු කරන බව	කරන්නේ නම්, ආර්ථික බවින් යුතුයව ආයෝජනය කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පළමු කොටසෙහි පරිච්ඡේද (ii) හි 6, 93(1), 126(1), 145 වගන්ති සහ 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 38 වගන්තිය	ආයතනය ස්ථාපිත කළ දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීම හා බදු ගෙවීමට ආයතනය කටයුතු කර නොතිබුණු අතර, ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සහතිකයක් ලබා ගැනීමට හෝ ආයතනය කටයුතු කර නොතිබුණි.	අප ආයතනය ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබාගන්නා ආයතනයක් වන අතර ආයතනය පිහිටුවීමේ සිට මේ දක්වා දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු ගෙවා නොමැති අතර ආයතනයේ කළමණාකරණය සමග සාකච්ඡා කර මහා භාණ්ඩාගාරයෙන් හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා මේ පිළිබද කටයුතු කරන බව	දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර බදු ගෙවීමට හෝ බද්දෙන් නිදහස් ආයතනයක් බවට සහතිකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී මුදල් රෙගුලාසි සංග්‍රහය**			
	(i) මුදල් රෙගුලාසි 138 (7), මුදල් රෙගුලාසි 139 (7) සහ මුදල් රෙගුලාසි 200 (4)	මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු නොකර ගොඩනැඟිලි නවීකරණ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධ අවසන් ගෙවීම වැය ලෙජරයේ රු.489,181 ක් ලෙස සටහන් කර සාවද්‍ය ලෙස රු.2,254,954 ක් වටිනා චෙක්පතක් ලියා රු.1,765,773 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවූ මුදල දින 20 ක් සාවද්‍ය පරිහරණයට ඉඩහැර ආපසු අයකරගෙන තිබුණද, මෙම අක්‍රමිකතාවය පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන විනායාකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.	සිදු වී ඇති වරද පිළිගන්නා අතර, එවැනි වැරදි නැවත සිදු නොවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලද බව	විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශ්ව සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
	(ii) මුදල් රෙගුලාසි 770 සහ මුදල් රෙගුලාසි	සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් නොමැතිව භාරයේ ඇති කිසිම භාණ්ඩයක් පොතෙන් අස් කිරීමට නොහැකි වුවත් ආයතනය විසින් රු.මිලියන 40.59 ක වටිනාකමැති	ව්‍යාපෘති මගින් ලබා ගන්නා සියළු උපකරණ විධිමත් පරිදි ප්‍රතිලාභීන්ට ලබා දී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය	මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු අතර නිවැරදි ප්‍රතිලාභීන්

	771	උපකරණ නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පොත්වලින් ඉවත් කර තිබුණි.	සහිතව එම උපකරණ භාවිතා කර පර්යේෂණ සිදු කරන විශ්වවිද්‍යාල හා වෙනත් රාජ්‍ය ආයතන වෙත විධිමත් පරිදි භාර දී ඇති බව	හඳුනාගත් බව තහවුරු කෙරෙන ලේඛන, විධිමත්ව ගිවිසුම් ගත වී අදාල උපකරණ භාරගත් බවට වන තහවුරු ලේඛණ විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 2.1 ඡේදය	රජයට අයත් සියලුම ඉඩම් තක්සේරු කිරීම අත්‍යාවශ්‍ය වන අතර එහිදී රජයේ කාර්යාල, නිවාඩු නිකේතන, වැඩපොළවල් ආදිය පිහිටා ඇති රජයේ ඉඩම් තක්සේරු කර ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවත් ආයතනය විසින් භුක්ති විදින අනුරාධපුර නගර සීමාවේ පිහිටි අක්කර 19 ක පමණ ඉඩම එපරිදි තක්සේරු කර නොතිබුණි.	ආයතනය විසින් භුක්ති විදින මෙම ඉඩම ආයතනයට පවරා දීමට ඉල්ලුම් කර ඇතත් තවමත් පවරා දී නොමැති බැවින් තක්සේරු කර ගිණුම් ගත කර නොමැති බව	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර කඩිනමින් තක්සේරු කිරීම කළ යුතුය.
(ඉ)	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 හා 2.2 හා 2.4 ඡේදයන්	2020 ජනවාරි 31 දිනට ප්‍රථම විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය සමඟ ලියාපදිංචි විය යුතු අතර 2.4 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ප්‍රථම වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පද්ධතියට උඩුගත (Upload) කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.	8/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මෙතෙක් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය සමඟ ලියාපදිංචි වී නොමැති නමුත් ඉදිරියේදී එසේ කටයුතු කරන බව	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත් ඉදිරි වර්ෂය සඳහා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර පාලනය සඳහා වන මෙහෙයුම් අත්පොත			
	(i) 6.6 ඡේදය	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර	මේ වන විට කෙටුම්පත සකස් කරමින් පවතින අතර, ඉදිරියේදී කඩිනමින්	ඉදිරි වර්ෂයේදී චක්‍රලේඛ විධිවිධානවලට

		නොතිබුණි.	ලබා දීමට කටයුතු කරන බව	අනුකූලව කටයුතු කිරීම තහවුරු වන වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
	(ii) 6.9 ඡේදය	පාඩු හෝ ලැබිය යුතු ශේෂ කපාහැරීමට පෙර ඒ සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ පූර්ව නිර්දේශය ලබා ගත යුතු වුවත්, එසේ ලබාගැනීමෙන් තොරව රු.194,173 ක අයකර ගත නොහැකි ශේෂ පොත්පත්වලින් කපා හැර තිබුණි.	මෙම ශේෂ ඉතා දීර්ඝ කාලයක් පැවති අක්‍රීය ගිණුම් ශේෂ වන අතර මේ ශේෂ සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා ලෙස සභාපතිවරයාගේ අනුමැතිය සහිතව ඉවත් කර ඇති අතර 171 වෙනි අධක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව	විධිවිධානවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගත යුතුය.
(උ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයහි			
	(i) 2.6 ඡේදය	අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස සුදුසුකම්ලත් සමාගම් ලේකම්වරයෙකු, වරලත් ගණකාධිකාරීවරයෙකු, නීතිඥවරයෙකු හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම්ලත් ස්වාධීන නිලධාරියෙකු පත්කළ යුතු අතර ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා හෝ ආයතනයේ වෙනත් කටයුතු වලට සම්බන්ධ නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු වුවත් ආයතනය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස එහි ප්‍රධාන විධායක නිලධාරී (අධ්‍යක්ෂ) පත් කර තිබුණි.	මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමටත්, ඊට පටහැනිව කටයුතු කර තිබීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
	(ii) 3.2 ඡේදය	මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ගතවීමට පෙර සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යය සාධන සමාලෝචන රැස්වීම (APRM) පැවැත්විය යුතු වුවත් 2023 වර්ෂයට අදාළව ආයතනය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.	2023 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සිට ඉදිරියට මෙම රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකිරීම පිළිබඳ විධිමත් පියවැ ගත යුතුය.

(iii)	ඇමුණුම iv හි 1 සහ 4 (අ) ඡේදය	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සහ අදාළ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා අනුව සකස් කර ඉදිරිපත් කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම ඉටුකිරීම සඳහා සහාය වීම විගණන කමිටුවේ එක් අරමුණක් වන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන විගණන කමිටුව විසින් සමාලෝචනය කළ යුතු නමුත් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා විගණන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණන කමිටුවට ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවට	ඉදිරි වර්ෂයේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ඍ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 අගෝස්තු 24 දිනැති අංක 06/2023 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	රාජ්‍ය අංශයේ ආයතන සඳහා මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම යටතේ වාහන සඳහා වන මොඩියුලය තුළට 2023 වර්ෂයේ සිට සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ආයතනයේ පවතින සියළුම වාහනවල තොරතුරු ඇතුළත් කර ඒ බවට වන සනාථ කිරීමක් අනුගාමී වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 හා 2024 වර්ෂයට අදාළව සනාථ කිරීම් සිදුකර නොතිබුණි. තවද වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාවය, රක්ෂණයට අදාළ තොරතුරු, නඩත්තු සහ අනතුරු තොරතුරු පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.	වාහනවල මූලික තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත 2023 දෙසැම්බර් 31 දිනට පෙර ඇතුලත් කර ඇති අතර අනෙකුත් තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරන බව	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතු අතර, එසේ නොකිරීමට අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,801,506 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.35,500,537 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,300,969 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.12,930,390 ක වත්කම් ඉවත් කිරීමේ අලාභයක් ගිණුම්ගත කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති වියදම රු.9,092,578 කින් ඉහළ යාම හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල විචලතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් වල විචලතාව පහත පරිදි විය.

ප්‍රභවය	2023 රු.	2024 රු.	විචලතාවය රු.	ප්‍රතිශතය %
ආදායම්				
භාණ්ඩාගාර වර්ථන ප්‍රදාන	118,443,000	127,976,679	9,833,679	8
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	10,234,226	27,066,630	16,832,404	164
ස්වයං උත්පාදන ආදයම්	16,668,791	19,932,412	3,263,621	19
වියදම්				
වැටුප් හා වේතන	94,017,991	112,211,050	18,193,059	19
සැපයුම් සහ පාර්භෝජන ද්‍රව්‍ය	18,529,555	26,323,460	7,793,905	42
වෙනත් වියදම්	17,934,030	16,008,854	(1,925,176)	11
පර්යේෂණ ව්‍යාපෘති වියදම්	3,971,691	3,506,353	(465,338)	12
සංවර්ධන ව්‍යාපෘති වියදම්	33,936,148	43,028,726	9,092,578	27

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයේ නිළධාරීන් විසින් පුද්ගලික අංශ සමඟ සම්බන්ධ වී සිදුකරන පර්යේෂණ ව්‍යාපෘති වෙනුවෙන් රජය විසින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට පර්යේෂණ දීමනා ලෙස රු. 8,780,987 ක් වියදම් කර තිබුණද එම පර්යේෂණවලින් රටේ ආර්ථිකයට සිදුව ඇති දායකත්වය සම්බන්ධයෙන් පසු විපරම් සිදුකළ හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.තවද, පුද්ගලික අංශය සමඟ ඒකාබද්ධ කරනු ලබන එම පර්යේෂණවල සොයාගැනීම් මඟින් ප්‍රතිලාභ රටේ සමස්ථ මහජනතාව වෙත ගලාඒමක් සිදුවන්නේද යන්න සනාථ නොවුණි.	සාමාන්‍යයෙන් පුද්ගලික අංශ සමඟ සිදු කරන පර්යේෂණයන්හි අරමුණ වන්නේ එම පර්යේෂණ වලට අදාලව ඉල්ලීම් සිදුකළ පාර්ශවය වෙනුවෙන් අවශ්‍ය තාක්ෂණය සපයා දීම වන අතර එම තාක්ෂණය වෙනත් බාහිර පාර්ශව වෙත ලබාදීමට ගිවිසුමට අනුව සිදුකළ නොහැක. එසේම එම තාක්ෂණය භාවිතා සම්බන්ධයෙන් අප විසින් පසුවිපරමක් සිදු කිරීම අවශ්‍ය නොවේ. නිලධාරීන් තිදෙනාගේ පර්යේෂණයට අදාල කටයුතු මේ වන විට නිම වී ඇති අතර වාර්තාව ඉදිරිපත් කිරීම පමණක් සිදු කළ යුතුව ඇත. රු.264,152 ක මුදල පර්යේෂණයේ මුල් මාස හය සඳහා පමණක් ගෙවා ඇති අතර එම මුල් මාස හය සඳහා අදාල කාර්යන්වල ප්‍රගතිය සහ එම වාර්තාව ශ්‍රී ලංකා කෘෂිකර්ම පයේෂණ ප්‍රතිපත්ති සභාව වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති බව	පුද්ගලික අංශය සමඟ ඒකාබද්ධව සිදුකරන පර්යේෂණවලින් ජාතික ආර්ථිකයට වන දායකත්වය සම්බන්ධයෙන් පසු විපරම් සිදුකළ හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

(ආ)	2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරු කරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් සිදු කිරීමටත් එම තොරතුරු වගකිවයුතු සියළුම පාර්ශව වෙත සන්නිවේදනය කිරීමටත් ආයතනය විසින් පියවර ගෙන නොතිබුණු අතර කෘෂිකර්ම අමාත්‍යාංශයට පමණක් වාර්තා කර තිබුණි.	නියැදි 500 ක් විශ්ලේෂණය කර අවසන් වාර්ථාව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත බාරදී ඇත. මෙම ව්‍යාපෘතියේදී කෘෂිකර්ම අමාත්‍යාංශය පාරිභෝගිකයා (customer) ලෙසත් ජාතික පසු අස්වනු කළමාකරන ආයතනය සේවාව සපයන්නා ලෙසත් ක්‍රියා කරන ලදී. ඒ අනුව අදාල සියළුම වාර්තාව කෘෂිකර්ම අමාත්‍යාංශයට හා විගණනයට ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු තීරණය කළ යුත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.	ව්‍යාපෘති වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් සිදු කළ යුතු අතර මෙවැනි නිරීක්ෂණ වගකිවයුතු සියළුම පාර්ශව වෙත සන්නිවේදනය කළ හඅන් වන පරිදි විධිමත් යාන්ත්‍රණයක් විධිමත් අනුමැතිය යටතේ සැකසිය යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයට 2021 සිට 2024 දක්වා වූ වර්ෂ 4 කාලපරිච්ඡේදය සඳහා පර්යේෂණ ව්‍යාපෘති 34 ක් වෙනුවෙන් රු.මිලියන 11.79 ක භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති 11 ක් සහ නව ව්‍යාපෘති 6 ක් වශයෙන් ව්‍යාපෘති 17 ක් පමණක් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු අතර සෙසු ව්‍යාපෘති 17 සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු වර්ෂය තුළ දී සිදු වී නොතිබුණි. භාණ්ඩාගාර ප්‍රදාන මගින් ආයතනය විසින් සිදුකරන පර්යේෂණ ව්‍යාපෘති මගින් රටේ ජාතික ආර්ථිකයට සිදුවන දායකත්වය මැනීම සඳහා සහ රජය වැයකරන මුදල් ආර්ථිකව කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා වන්නේද යන්න පිළිබඳ සොයා බැලීමට පසුවිපරම් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2021 සිට 2024 වර්ෂයේ කාල පරිච්ඡේදය තුල සිදුකල පර්යේෂණ 34 අතුරින් 2024 තුලද ක්‍රියාත්මක වූ පර්යේෂණ 17 හැරුණු විට අනෙකුත් පර්යේෂණ 17, 2024 වර්ෂය වන විට අවසන්ව පැවතුනි. සාමාන්‍යයෙන් ආයතනයේ වාර්ෂික සැලැස්මට ඇතුලත් කරනුයේ එම වර්ෂයේ ආරම්භ කරන ලද හා පසුගිය වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද අදාල වර්ෂයේදී ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති පමණි. නිමකල පර්යේෂණ පසු විපරමක් ලෙස ආයතනයේ පර්යේෂණ සමාජගත කිරීමේ කමිටුව හරහා එම තාක්ෂණයන්, තාක්ෂණ ප්‍රචාරන අංශය මගින් ක්ෂේත්‍රයට ලබා දීමක් සිදු කරනු ලබන බව	පර්යේෂණ ප්‍රතිඵල වලින් ජාතික ආර්ථිකයට වන දායකත්වය පසුවිපරම් කල හැකි ක්‍රමවේදයක් සකස් කල යුතුය.
(ආ)	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති යටතේ වූ design and development of monkey and bat repellent device	මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු ලෙස වඳුරන් සහ රිලවුන් සඳහා විකර්ශක උපකරණයක් සැලසුම්	ඉදිරියේදී පර්යේෂණ ප්‍රතිඵල මගින් ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා ගත හැකි

	පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා 2024 දෙසැම්බර් 31 දිනට රු.439,038 ක වියදමක් දරා තිබුණු අතර වර්ෂය අවසන් දිනට භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස වාර්තා කර තිබුණද ඒ තුළින් සොයාගත් උපකරණය අදාළ අරමුණ සඳහා යොදා ගත හැකි පරිදි සමාජ ගත කර නොතිබුණි.	කිරීම සහ සංවර්ධනය කිරීම වන අතර එම උපකරණය භාවිතයෙන් වඳුරන් සහ රිලවුන් සඳහා විකර්ෂක සංඛ්‍යාත හඳුනාගැනීමට යෝජිත විය. එම අරමුණ ඔස්සේ මෙම ව්‍යාපෘතිය මගින් විකර්ෂක උපකරණයක් නිර්මාණය කර ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් විකර්ශක සංඛ්‍යාත හඳුනාගැනීම සිදු කරන ලදී. කැලෑ වඳුරන් මෙම උපකරණයට සැලකිය යුතු විකර්ශනයක් පෙන්නුම් කළ නමුත් නාගරික පෙදෙස් වල වඳුරන් බොහෝ දුරට එය නොසලකා හැර ඇති බව හෙළිවූ බව	මට්ටමට ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර, නිමවා ඇති උපකරණය තවදුරටත් සංවර්ධනය කිරීමේ හැකියාව පවතින්නේද යන්න විධිමත් අධ්‍යයනයකින් පසුව තීරණය කළ යුතුය.
(ඇ)	2024 වර්ෂයේ නව පර්යේෂණ ව්‍යාපෘති 6 ක් වෙනුවෙන් රු. මිලියන 8.93 ක් වෙන්කර තිබුණද, ඉන් වියදම් කර තිබුනේ රු.මිලියන 4.2 ක් පමණි. ඉන් study on aflatoxin contamination in maize and its possible control measures ,සහ value additions to crop wastage at economic centers in Sri Lanka: a sustainable waste management approach පර්යේෂණ ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 5.4 ක් සහ රු.මිලියන 1.15 ක් වෙන්කර තිබුණද වර්ෂය තුළ රු.මිලියන 2.9 ක් සහ රු. 263,490 ක් ලෙස සියයට 48 කටත් වඩා අඩු මුදලක් වැය කර තිබුණි. එසේම එම පර්යේෂණවල ව්‍යාපෘති යෝජනා සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අනුමැතිය ලබාගෙනද නොතිබුණි.	ඇතැම් ව්‍යාපෘතිවල අයවැය කපාහැරීමෙන් පසුව ක්‍රියාකාරී සැලසුම සංශෝධනය කිරීමට අවස්ථාවක් නොලැබුණ අතර පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට අදාල අනුමැතීන් අමාත්‍යාංශ හරහා සිදු කරයි. එසේම අදාල ව්‍යාපෘති යෝජනා සකස් කිරීම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව සිදු කරන බැවින් නැවත ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනය මගින් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු සිදු නොකළ අතර එම ආයතනය විසින් විමසීම් සිදු කරන අවස්ථා වලදී පමණක් අදාළ තොරතුරු ඔවුන් වෙත ලබාදීම සිදු කරනු ලබන බව	පර්යේෂණ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අනුමැතිය නොගැනීමත්, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ඉටුකළ යුතු කාර්යයන් වර්ෂය තුල ඉටු නොකිරීමත් සම්බන්ධයෙන් අදාල පාර්ශ්ව වෙත විධිමත් පියවර ගැනීමත් ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.

(ඇ)	2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වා දීමේ පර්යේෂණයේ (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීමට හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715 ක් වැය කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි.	මෙම මුදල වැයවී ඇත්තේ පර්යේෂණයට අදාල අත්‍යාවශ්‍ය විද්‍යාගාර විශ්ලේෂණයට අවශ්‍ය උපකරණ සහ ප්‍රතිඵල වානිජ භාවිතය සඳහා සමාජගත කිරිමට අවශ්‍ය වන උපකරණ මිළදී ගැනීමටය.ඒ අනුව පර්යේෂණය නියමිත පරිදි සිදු කළද හඳුනාගත් තාක්ෂණයන් වාණිජව භාවිතා කිරීමේ ශක්‍යතාව අඩු බැවින් සමාජගත නොකරන ලදි. එසේ වුවත්, මෙම පර්යේෂණය සඳහා මිලදි ගත් උපකරණ පසු අස්වනු පර්යේෂණ සඳහා අත්‍යාවශ්‍ය උපකරණ වන අතර පර්යේෂණ රැසකට එම උපකරණ භාවිතා කොට ඇති අතර මෙම පර්යේෂණය ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03ක් සිදු කර ඇති බව	පර්යේෂණ ප්‍රතිඵල මඟින් ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා ගත හැකි මට්ටමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සංවර්ධනාත්මක වැඩපිළිවෙලක් කඩිනමින් හඳුන්වා දිය යුතුය.